අනන්‍යතාවය අවශ්‍ය ද?

හිරු සී.අයි.ඒ. කණ්ඩායම විසින් හෙළිදරව් කළ, බත්තරමුල්ල ආගමන විගමන කාර්යාලය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන තැරැව්කරුවන්ගේ ජාවාරමක් සම්බන්ධයෙන්, හිරු රාත්‍රී ප්‍රධාන පුවත් (මැයි 17, 2023) ඔස්සේ විකාශය විණි.

එහිදී, එම ජාවාරමේ නිරත වන බවට පැවසෙන, මත්ද්‍රව්‍ය වලට ද ඇබ්බැහි වූ බව එසේම පැවසෙන අයෙකුගේ ප්‍රකාශයක් ද ඉදිරිපත් වී තිබිණි. එහිදී එම පුද්ගලයාගේ අනන්‍යතාවය සැඟවීමක් සිදු කර නොතිබුණි.

විමර්ශණාත්මක පුවත් ඉදිරිපත් කිරීමක් ලෙසින්, එවැනි ජාවාරමක් සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම කිසිසේත්ම ගැටළුකාරී නොවේ. කෙසේ නමුත්, එහිදී, එම පුද්ගලයාගේ කැමැත්ත මත එම ප්‍රකාශය වීඩියෝගත කර තිබේද යන්න, නැතිනම් එම ප්‍රකාශය අඩංගු වීඩියෝව පුවත් විකාශය ඔස්සේ පළ කරන බවට එම පුද්ගලයාව දැනුවත් කර තිබේද යන්න ප්‍රශ්නකාරී වේ.

1) හිරු ටීවී කණ්ඩායම විසින්, එම වීඩියෝ පටය විකාශය කිරීම සඳහා අදාළ පුද්ගලයාගේ අනුමැතිය ලබාගෙන තිබෙන්නේද?

2) ජාවාරමට සම්බන්ධ බවට පැවසෙන, එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් ද ඇතැයි පැවසෙන අයෙකුගේ අනන්‍යතාවය, ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග සිදුවීමටත් පෙර, මාධ්‍ය ඔස්සේ හෙළිකිරීම කෙතරම් යෝග්‍ය ද?

3) එම අනන්‍යතාවය නීති අංශ වෙත යොමු කිරීමේ ගැටළුවක් නැති වුවත්, රූපවාහිනී පුවත් විකාශයක් ඔස්සේ එවැනි අයෙකුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම, එවැනි ජාවාරමක් මර්දනය කිරීමට ද බාධා නොපමුණුවනු ඇති ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

